# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2251/84 - 2021 ඔක්තෝබර් මස 30 වැනි සෙනසුරාදා - 2021.10.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රා.ලේ.යොමු අංකය* : 9/3/5/50.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/5/2018/HA/105.

වාලවෙල ග්‍රාම නිලධාරි වසමේ සේවා පියස ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :*

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අස්ගිරි උඩසිය පත්තුව සුළු කොට්ඨාසයේ අංක E334B වාලවෙල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වාලවෙල ගමේ පිහිටි සර්වේ ජනරාල්ගේ මූලික පිඹුරු අංක මා 1844 හි සඳහන් වාලවෙල කුඹුර හෙවත් මාලිගාවේ කුඹුර නැමැති ඉඩමේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0607 ක් වූ බිම් කොටස.

01. කැබලි අංක 01
ඉඩමේ නම: වාලවෙල කුඹුර හෙවත් මාලිගාවේ කුඹුර; විස්තරය: වාලවෙල ග්‍රාම නිලධාරි වසමේ සේවා පියස ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීම; හිමිකම් කියන අය: වාලවෙල පමුණුව ගොවි සංවිධානය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0607.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2021.12.15 දින පෙ.ව.10.00 ට යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2021.12.01 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

ඩී.ආර්.කේ. හෙන්නායක,
ප්‍රාදේශීය ලේකම්,
යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

2021 ඔක්තෝබර් මස 27 වැනි දින,
යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11-280


G 35245 - 13 (2021/10)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.